**සියලු ම විභාග අපේක්ෂකයින් වෙත,**

**සෞඛ්‍ය ආරක්ෂාව සඳහා උපදෙස් :**

1.සියලුම විභාග අපේක්ෂකයින් විසින්

- මුඛ ආවරණ පැළඳ සිටිය යුතුය.
- මෙම දෙපාර්තමේන්තු පරිශ්‍රය සීමිත ඉඩ පහසුකම් පවතින කාර්යාලයක් බැවින් විභාග අපේක්ෂකයා සමඟ වෙනත් පිරිස් පැමිණීමෙන් වළකින ලෙස කාරුණිකව දන්වමි. සෞඛ්‍ය ආරක්ෂාව වෙනුවෙන් විභාග අපේක්ෂකයා පමණක් මෙම දෙපාර්තමේන්තු පරිශ්‍රයට ඇතුළත් කර ගනු ලැබේ.

**විභාගය සඳහා උපදෙස් :**

1.**<u>ප්‍රවේශ පත්‍රයේ අත්සන සහතික කිරීම</u>** - තමා සේවය කරන **ආයතනයේ ප්‍රධානියා විසින් හෝ ආයතන ප්‍රධානියා බලය පවරන ලද නිලධරයකු** විසින් හෝ සහතික කර නිල මුද්‍රාව තැබිය යුතුය. සාමදාන විනිසුරුවන් හෝ වෙනත් අය අත්සන සහතික කිරීම **වලංගු නොවේ.**

2.ශ්‍රවණ කුසලතා පරීක්ෂණය සඳහා මෙම දෙපාර්තමේන්තුවට පැමිණෙන දින ඔබට ලබා දී ඇති වේලාවට විභාගයට පැමිණීම අනිවාර්ය වේ. කිසිදු හේතුවක් නිසා ඔබට ලබා දී ඇති **දිනය සහ වේලාව වෙනස් කරනු නොලැබේ.**

3.එහිදී පහත සඳහන් ලේඛන ඉදිරිපත් කළ යුතුය.

I. මුදල් ගෙවූ කුවිතාන්සියේ මුල් පිටපත (ඡායා පිටපත භාරගනු නොලැබේ).

II. රාජ්‍ය භාෂා ප්‍රවීණතා ලිඛිත විභාගය සමත් ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපතක්/ අ.පො.ස. (සා.පෙළ) පළමු බස හෝ අ.පො.ස. (සා.පෙළ) දෙවන බස සමත් ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපතක්.

III. ජාතික හැඳුනුම්පත / වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය. (රාජකාරි හැඳුනුම්පත හෝ වෙනත් හැඳුනුම්පත් පිළිගනු නොලැබේ.)

IV. අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ඔබ විසින් ඉදිරිපත් කරන ලේඛනයේ සහ විභාග ප්‍රවේශ පත්‍රයේ සඳහන් නමෙහි හෝ ජාතික හැඳුනුම්පත් අංකයේ වෙනසක් තිබේ නම්, නිවැරදි නම හෝ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කර ***<u>ආයතන ප්‍රධානියාගේ අත්සනින් හෝ ආයතන ප්‍රධානියා විසින් බලය පවරන ලද නිලධරයකු විසින් හෝ අත්සන් කරන ලද හා නිලමුද්‍රාව තබන ලද ලිපියක් හා අනන්‍යතාව තහවුරු කිරීමට ඉදිරිපත් කරන ලේඛනයේ ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුවේ.</u>***

4.ඉහත සඳහන් **ලිපි ලේඛන එකක් හෝ එදිනට ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේ නම් ඔබට විභාගය සඳහා පෙනී සිටීමට අවස්ථාව නොලැබේ**. අදාළ ලේඛන පසුව ඉදිරිපත් කිරීමේ පදනම මත හෝ විභාගයට පෙනී සිටීමට අවස්ථාව ලබා දෙනු නොලැබේ.

5.පිළිතුරු ලිවීම සඳහා අනිවාර්යයෙන් නිල් පෑනක් රැගෙන ආ යුතුය.

**ඔබගේ ප්‍රවේශ පත්‍රය සමඟ මෙම කොටස අමුණා විභාගය සඳහා අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතුය.**

**ආයතන ප්‍රධානියාගේ  සහතිකය**

.................................................................................................................. මයා /මිය/ මෙනවිය අර්ධ රාජ්‍ය සේවයේ නිලධාරියෙකු බවත් කළමනාකරණ  සේවා චක්‍රලේඛ 1/2023 අනුව රාජ්‍ය  භාෂා ප්‍රවීණතාව ලබාගැනීම සඳහා අදාළ සුදුසුකම් සපුරා ඇති බවට සහතික කරමි.

..........................................................................................

ආයතන ප්‍රධානියාගේ  අත්සන

නිල මුද්‍රාව:

පහත සඳහන් ඇමුණුම් ප්‍රවේශ පත්‍රය සමඟ අමුණා ඇත.

| ඇමුණුම | ඇත | නැත |
|---|---|---|
| රාජ්‍ය භාෂා ප්‍රවීණතා ලිඛිත විභාගය සමත් ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපතක්/ අ.පො.ස. (සා.පෙළ) පළමු බස හෝ අ.පො.ස. (සා.පෙළ) දෙවන බස සමත් ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපතක්. | | |
| මුදල් ගෙවූ කුවිතාන්සියේ මුල් පිටපත | | |
| නමෙහි හෝ ජාතික හැඳුනුම්පත් අංකයේ වෙනසක් තිබේ නම් පමණක් , ඊට අදාළ ලේඛන ........................................................................................................................... .......................................................................................................................... | | |